**වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------**

වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹී 2009 ජූනි 29 දිනැති අංක 2477 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ සහ 2009 ජූනි 29 දිනැති අංක 0129/0130 එස්ආර්අයි (එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹී 2013 පෙබරවාරි 13 දිනැති අංක 2977- එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ, ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මන්නාරම, වවුනියාව සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල නාගරික ජනගහනයේ භෞතික සුභසාධනය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති හා ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 19,165 කට සමාන එජඩො මිලියන 163.33 ක් වූ අතර ඉන් රු. මිලියන 11,809 කට සමාන එජඩො මිලියන 99.78 ක් ණයක් ලෙස සහ රු.මිලියන 2,649 කට සමාන එජඩො මිලියන 23.22 ක් ප්‍රදානයක් ලෙස ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ජල මූල්‍යයන හවුල්කරු පහසුකම් සඳහා රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 2 ක ප්‍රදානයක් ආසියානු සංවර්ධන බැංකුව හරහා සිදු කිරීමට නෙදර්ලන්ත භාර අරමුදල ද (නෙ හා අ) එකඟ වී තිබූ අතර රු. මිලියන 4,479 කට සමාන එජඩො මිලියන 38.33 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 නොවැම්බර් 13 දින ආරම්භ කළ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාතියේ කාර්යය නිම කිරීමේ දිනය 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු, ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | 135.47 | රජයෙන් ලත් දායකත්වය අව ප්‍රමාණවේ. | ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු, රජයේ අරමුදල්වලට එරෙහිව හිලව් කල හැක. | රජයෙන් ලත් මුළු දායකය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද පොළී හා බැඳීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 404.10 | විදේශ උපයෝජන අව ප්‍රමාණ වේ. | මෙය මුදල් අමාත්‍යාංශයේ පිරිවැයක් ලෙස සැලකේ. එම නිසා ගිණුම්වලට ගෙන නැත. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ඒඩීබී ආයතනය වෙත කරන ලද ආපසු ගෙවීම් වටිනාකම රු.82,869 ක් වූ අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ ඒඩීබී ආයතනයේ වාර්තා අනුව එය පිළිවෙලින් එජඩො 449 ක් සහ එජඩො 20 ක් විය. කෙසේ වුවද, එජඩො 429 ක් වූ වෙනස සැසඳීමට ක්‍රියා කර නොතිබුණි. | | ඒඩීබී වෙත කරන ලද ආපසු ගෙවීම්වල වෙනසක් ඇත. | ව්‍යාපෘතිය විසින් මහ බැංකුවේ අග්‍රිම ගිණුම් වාර්තා සමග උපයෝජනයන් සසඳන ලදී. ආපසු ගෙවන ලද වටිනාකම රු.82,869.54 කට සමාන එජඩො 469.23 ක් වන අතර ඒ බව ව්‍යාපෘතිය විසින් ඒඩීබී ආයතනයට දැනුම් දෙන ලදී. | අග්‍රිම ගිණුමේ ශේෂය ඒඩීබී වාර්තා සමග සැසඳීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ කාර්යයන්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ජල හා සනීපාරක්ෂණ යටිතල පහසුකම් වර්ධනය කිරීම සහ උතුරු හා වයඹ ප්‍රදේශවල ජල අංශයේ ආයතන ශක්තිමත් කිරීම යන සංරචක යටතේ උතුරු හා වයඹ පළාත්වල නාගරික ජනතාවගේ භෞතික සුභ සාධනය වැඩි දියුණු කිරීම පිණිස ජල සම්පාදන හා සනීපාරක්ෂණ කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කර තිබුණි.

| කාර්යය | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අපේක්ෂිත ඒකක | සත්‍ය ඒකක | | |
| ප්‍රධාන ජල සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතිය සඳහා නල, වැල් හා සවි කිරිම් සැපයීම හා එළීම. | | | | |
| (අ) වවුනියාවේ ප්‍රධාන ජල සම්ප්‍රේෂණ මාර්ගවල නල එළීම | කි.මී.24 | කි.මී.22 | නිම කිරීමේ ප්‍රමාදය මත ආනුෂංගික වියදම් ඉහළ යනු ඇත. | ව්‍යාපෘති කාලය තුළ වැඩ නිම කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) මන්නාරමේ එළුතුර් සිට පේසාලේ දක්වා සම්ප්‍රේෂණ නල එළීම් | කි.මී.16 | කි.මී. 11 | ණය කාල සීමාව 2019 ඔක්තෝබර් අවසන් වේ. එම නිසා රජයට අතිරේක පීඩනයක් ඇති විය හැක. | කාර්යය නිම කිරීම සඳහා කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඇ) හලාවත සිට පුත්තලම දක්වා බෙදා හැරීම් නල එළීම් | කි.මී 48.9 | කි.මී.36 | ව්‍යාපෘතිය කාලය තුළ කාර්යය නිම කිරීම ප්‍රමාද වීමේ හැකියාවක් පවතී. | කාර්යය නිම කිරීම සඳහා කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ කාර්ය නිම කළ යුතු වුවද, ඒ බව නොසලකා ව්‍යාපෘතිය විසින් මුළු පිරිවැය රු. මිලියන 244.88 ක් වූ අතිරේක පයිප්ප එළීම් කොන්ත්‍රාත් 04 ක් පාර්ලිමේන්තු නියෝජිතයෙකුගේ ඉල්ලීම මත 2018 සැප්තැම්බර් හා නොවැම්බර් මාසවල කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ප්‍රදානය කර තිබුණි. කි.මී 28.5 ක් වූ මුළු | ව්‍යාපෘති කාලය නිම වුවද, කාර්යයන් අවසන් කර නොතිබුණි. | නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ නිර්දේශය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පයිප්ප එළීම් මාර්ග දීර්ඝ කරන ලදි. කාර්යය කඩිනම් කිරීම සඳහා කි.මී. 16 ක් වූ මන්නාරම නල එළීම් දුර කොන්ත්‍රාත් දෙකකට වෙන් කරන | නව කොන්ත්‍රාත්තුවලට එළඹීමට පෙර ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය හැකියාව ව්‍යාපෘතිය විසින් තක්සේරු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නල එළීම් දුරෙන් මන්නාරම් දිස්ත්‍රික්කයේ කි.මී 16 ක නල එළීම් දුර ප්‍රමාණය කොන්ත්‍රාත් දෙකක් ලෙස කැඳවීම් කර තිබුණද අවසානයේ එකම කොන්ත්‍රාත්කරුවෙකුටම ප්‍රදානය කර තිබුණි. | | ලදි. කෙසේ වුව ද, ටෙන්ඩර් ක්‍රියාවලිය අනුව එක් කොන්ත්‍රාත්කරුවෙක් පමණක් තේරුණු බැවින් එම කොන්ත්‍රාත්කරුටම කොන්ත්‍රාත් දෙකම ප්‍රදානය කරන ලදි. | |
| (ආ) | **PIPES/MAN/29-A** සහ **PIPES/MAN/29-B** යන කොන්ත්‍රාත් 2018 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කළ යුතුය. කෙසේවුවද, ව්‍යාපෘති අධ්‍යක්ෂකගෙන් කොන්ත්‍රාත් නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනෙන් පසුවත් මෙම කොන්ත්‍රාත්තුවල කාර්යයන් අඛණ්ඩව කරගෙන යමින් පැවතුණි. | ව්‍යාපෘති කාර්යයන්ගේ මෙහෙයුම් යාන්ත්‍රණය දුර්වල නිසා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම. | අධික වර්ෂාව නිසා නල එළීම් ප්‍රදේශවල ජල මට්ටම ඉහළ යාම, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය හරස් මාර්ගවල නල එළීම් සඳහා අනුමැතිය නිකුත් කිරීම ප්‍රමාද වීම, අප්‍රේල් 21 දින බෝම්බ පිපිරීම ආදිය මත කොන්ත්‍රාත් කාර්යය ප්‍රමාද විය. කාර්යය නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදි. | 2019 ඔක්තෝම්බර් මස ණය කාලය අවසාන වීම නිසා ව්‍යාපෘති කාර්යය නිම කිරීමට කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කාර්යය 2019 ඔක්තෝබර් 31 දින වන විට අවසන් වුවද, හලාවත , පුත්තලම හා වවුනියාව දිස්ත්‍රික්කවල නිම කරන ලද විවිධ ඉදිකිරීම් සහිත ඉඩම්වල හිමිකාරීත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වල හිමිකාරීත්වය පවරා ගැනීම ප්‍රමාද වීම, ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලැබීමේ ප්‍රමාදය කෙරෙහි බලපෑ හැක. | ඉඩම් අත්පත් කර ගැනීම හා අයිතිය පැවරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉඩම් අංශය සිදු කරයි. ඉඩම් අංශය විසින් පිරිවැය රු.6,847,530.54 ක් සඳහා වත්කම් වාර්තා ලබා දී ඇත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉඩම්වල හිමිකම පවරා ගැනීමට කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| මාර්ග පුනස්ථාපන කටයුතු සඳහා 2016 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියේ බැංකු ගිණුමට කරන ලද රු.49,445,124.44ක් වූ තැන්පතුවේ වලංගු කාලය ඉක්ම ගියද, 2019 දෙසැම්බර් 31 දින විටත් එය අය කර ගෙන නොතිබුණි. | මූල්‍ය කලමනාකරණ දුර්වලතාවයකි. | මාර්ග සංවර්ධන අධිකාරියට කරන ලද තැන්පතු අය කර ගැනීමට කාර්ය මණ්ඩලය ක්‍රියා කරමින් සිටී. | ඉතිරිව තිබෙන ශේෂ අය කර ගැනීමට කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3.4 පෙර විගණන වාර්තාවෙන් පෙන්වා දුන් නොවිසඳුණු කරුණු

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්කුලම් හී ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමකින් තොරව වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ අවබෝධතා ගිවිසුමක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, සහකාර කොමසාරිස් ඒ අනුව කාර්යය නොකිරීම නිසා කටයුතු ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් අතිරේක වන්දි හා යටිතල පහසුකම් ලෙස ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් එකතුව රු.මිලියන 21.8ක් පසුගිය වර්ෂයන්හි ගෙවා තිබුණි. | අතිරේක වන්දි හා යටිතල පහසුකම් ලෙස එකතුව රු. මිලියන 21.8 ක් ව්‍යාපෘතියට දැරීමට සිදු වී ඇත. | අප විසින් දැනටමත් මෙම අලාභය පිළිබඳ වවුනියාවේ ප්‍රාදේශීය ලේකම් සහ ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. අප විසින් මෙම ගැටළුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නීති නිළධාරි හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත. | ව්‍යාපෘතිය ඇවර කිරීමට ප්‍රථම ගැටළුව විසඳීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එක්ව ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය | ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි විය හැක. | නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ව්‍යාපෘතිය සහ ජල | ව්‍යාපෘතිය ඇවර කිරීමට පෙර ගැටළුව විසඳීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කල යුතු බවට 2013 අප්‍රේල් 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමකදී තීරණය කර තිබුණි. කෙසේවුවද, දෙපාර්ශවය විසින් සුදුසු යාන්ත්‍රණයක් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් ක්‍රියාත්මක කර නොතිබුණි. | | සම්පාදන මණ්ඩලය විසින් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය සඳහා විවිධ යාන්ත්‍රණ ක්‍රියාත්මක කරන ලදි. | |

## 3.5 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 133 සහ 2016 ජුනි 10 දිනැති කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් බඳවා ගැනීමට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණය අංශය සම්බන්ධ කර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. . | දුර්වල අභ්‍යන්තර පාලන පද්ධතියකි. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර නොමැත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂිකව අභ්‍යන්තර විගණනය සිදු කරයි. | අභ්‍යන්තර විගණනකවරයෙක් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |